# අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK

## පෙරදිග සංගීතය (සිංහල)

## 10 ශ්‍රේණිය

1 පත්‍රය

1. ගුත්තිල කාව්‍යයේ එන ගීත
   1) නාඩගම් වේ. 2) නාට්‍ය ගීත වේ. 3) සේ ගී වේ. 4) ගැමි ගී වේ.
2. සර්ව කෝමල රාගයකි.
   1) භූපාලි 2) යමන් 3) කාෆි 4) භෛරවි
3. පුත්තලම මඩකලපුව වැනි මුහුදුබඩ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති ගීත විශේෂය වන්නේ
   1) නූර්ති 2) කපිරිඤ්ඤා 3) කෝලම් 4) සොකරි
4. එකෝඩියන් වාද්‍ය භාණ්ඩය
   1) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකි. 3) තත් වාද්‍ය භාණ්ඩයකි.
   2) තාල වාද්‍ය භාණ්ඩයකි. 4) ඝන වාද්‍ය භාණ්ඩයකි.
5. ග්‍රැමෆෝන් තැටි යුගයේදී මුල් කාලයේ අසන්නට ලැබුණු ගීත විශේෂය වන්නේ
   1) නාඩගම් ගී 2) සරල ගී 3) චිත්‍රපට ගී 4) නූර්ති ගී
6. අනාඝාතාත්මක ගැමි ගීයක් වන්නේ
   1) නෙළුම් ගී 2) පතල් ගී 3) ගොයම් ගී 4) කමත් ගී
7. සංකීර්ණ භාෂාවක් ග්‍රන්ථාරූඪව පැවත එන ගී විශේෂයක් වන්නේ
   1) සේ ගී 2) නූර්ති ගී 3) නාට්‍ය ගී 4) පාරු ගී
8. නව නාට්‍යයක් නොවන්නේ
   1) මනමේ 2) හුණුවටය 3) ටෙලිනාට්‍ය 4) කැළණි පාලම
9. දක්ෂ බටනලා වාදකයෙකි.
   1) ශකීර් හුසේන් 3) අල්ලා රක්බාබාන්
   2) හරිප්‍රසාද් චෞරසියා 4) අමීර් චුෂ්රූ
10. කපිරිඤ්ඤා ගීත සඳහා යොදා ගන්නා තාලය වන්නේ
    1) දාදරා 2) ත්‍රිතාල් 3) කෙහෙර්වා 4) ඩෙම්ටො
11. ග්‍රැමෆෝන් ගී තැටි යුගයේ ගායකයෙකි.
    1) W D අමරදේව 3) වික්ටර් රත්නායක
    2) H W රූපසිංහ 4) නන්දා මාලනී
12. මට / මැ s නි ච / ගෙa s ම ට / පි යා s ච / ගේ s ම ට
    මෙම ගීතය ආරම්භ වන්නේ
    1) සමග්‍රහයෙනි 2) අවග්‍රහයෙනි 3) විෂමග්‍රහයෙනි 4) ආඝාතයෙනි
13. එකම ස්වර වාදනයේදී වයලීනයේ හා බටනලාවේ තරංග ඊස්තාරය අසමාන වේ. ඊට හේතුව වන්නේ
    1) තාරතාවය 2) ධ්වන ගුණය 3) රූප භේදය 4) විපුලතාවය
14. එකම ආකාරයට සුසර කරන සංගීත භාණ්ඩ යුගලයකි.
    1) සිතාරය, වයලීනය 3) වයලීනය, මැන්ඩලීනය
    2) වයලීනය, වීනාව 4) වයලීනය, ගිටාරය
15. ගිටාරයේ තත් සුසර කරනුයේ
    1) ග ධ රි ස නි ග 3) ග ධ ප නි ග රි
    2) ග ධ රි ප නි ග 4) ග ධ ග නි ප රි
16. තබ්ලාවේ බායාවෙන් හා දායාවෙන් එකතුවෙන් වැයෙන අක්ෂර වන්නේ
    1) බ ට 2) න ත 3) ගි ගෙ 4) බ ධිං
17. කෝඩ්ස් වාදනය කල හැකි තත් භාණ්ඩයකි.
    1) සිතාරය 2) එස්රාජය 3) වයලීනය 4) ගිටාරය
18. සමාජයීය ගී විශේෂයක් වන්නේ
    1) පාරු ගී 2) යාග ගී 3) දරු නැලවිලි ගී 4) පතල් ගී
19. ස්වර 2 ක් පමණක් විකෘතිවන රාග යුගලයකි.
    1) භීමපලාසී - බිලාවල් 3) භීමපලාසී - කාෆී
    2) භූපාලි - යමන් 4) කාෆී - භෛරවී
20. 0. මෙම සංකේතය හඳුන්වනු ලබන්නේ
    1) ඩොටඩ් මිනිම් ලෙසිනි. 3) ඩොටඩ් සෙමිබ්‍රිව් ලෙසිනි.
    2) ඩොටඩ් ක්‍රොචට් ලෙසිනි. 4) ඩොටඩ් ක්වයව ලෙසිනි.



edulanka.lk

21. හින්දුස්ථානී තාල වාදනය කරනු ලබන්නේ
   1) මෘදංගයෙනි  2) තබ්ලාවෙනි  3) ගැටබෙරයෙනි  4) රබානෙනි

22. කාෆී රාගයේ ශුද්ධ නිශාධය
   1) වාදී ස්වරයක් ලෙස යෙදේ
   2) සංවාදී ස්වරයක් ලෙස යෙදේ
   3) විවාදී ස්වරයක් ලෙස යෙදේ
   4) වර්ජන ස්වරයක් ලෙස යෙදේ

23. ගීතයක හඳුන්වා දීමේ වාදනයට අයත් කොටස හඳුන්වනු ලබන්නේ.
   1) Inter යනුවෙනි
   2) Intro යනුවෙනි
   3) Adlip යනුවෙනි
   4) Bit යනුවෙනි

24. ජප් තාලයේ මාත්‍රා
   1) 10 කි.  2) 14 කි.  3) 15 කි.  4) 6 කි.

25. සැ දැ s / ක ලු ව ර / කු ර ග / ගා s වි ත් / යන ගීතයට උචිත තබ්ලා තාලය කුමක්ද?
   1) දාදරා  2) චෙම්ටෙ  3) ජප්  4) දීන්චන්දි

26. සමුද්‍රඝෝෂ විරිතට අනුව ගැයෙන ගීතයකි.
   1) බැද්දවටට සුදු මොරමල්
   2) අම්මාවරුනේ
   3) ලස්සන හිම වතේ
   4) පැහැ සරණිය මිණි පැමිණිය

27. භෛරවී රාගය ආශි(ත නිර්මාණය වුන සරල ගීතයකි.
   1) ............................  2) සැඳෑ අඳුර  3) මධුර යාමේ  4) කවිය ඔබ

28. හාමනි Harmony යනු
   1) ස්වර එකතු වීමයි.
   2) ස්වර සුසංගත වීමයි.
   3) ස්වර වැඩි වීමයි.
   4) ස්වර වෙනස් වීමයි.

29. පරිගණක ආශ්‍රිත සංගීතයේ වාසියකි
   1) ගුණාත්මක බව වැඩි වීමයි.
   2) තාත්වික බව
   3) කෘතිම බව
   4) විශාල ශිල්පීන් ප්‍රමාණයකගේ දායකත්වය එක පුද්ගලයකුට කල හැකි වීම

30. නාදය ගබඩා කල පැරණි තාක්ෂණ ක්‍රමයකි.
   1) CD  2) DVD  3) ග්‍රැමෆෝන් තැටි  4) MP3

31. සරල ගීතයක ආරම්භක සංගීතය
   1) Interlood
   2) Bit
   3) Introduction
   4) Chorus

32. රි ග ධ නි ම / පිළිවෙලින් බටහිර ක්‍රමයට ලියූ විට
   1) $C^{\#}$ $E^{b}$ $A^{b}$ $B^{b}$ $F^{\#}$
   2) $C^{\#}$ $E^{b}$ $A^{b}$ $B^{b}$ F
   3) $D^{b}$ $E^{b}$ $A^{b}$ $B^{b}$ F
   4) C $E^{b}$ $A^{b}$ $A^{b}$ $F^{\#}$

33. සයිලෆෝනය හා ස්ලොකන්ස්පීලය
   1) තත් වාද්‍ය භාණ්ඩ වේ.
   2) ස්වර වාද්‍ය භාණ්ඩ වේ.
   3) සුසිර වාද්‍ය භාණ්ඩ වේ.
   4) ඝන වාද්‍ය භාණ්ඩ වේ.

34. ජන ගී ආශ්‍රිතව නිර්මාණය වූ සංගීතයකි.
   1) සුපිපුණු සුගන්ධ
   2) එන්න මද නලේ
   3) සතිය සඳච්චට රෝදය
   4) සැඳෑ අඳුර ලොව

35. කාලගෝල සිංහබාහු මනමේ නාට්‍ය වල ගීත පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ
   1) ආලෙ බැන්ද, ගල්ලෙන බිඳලා, ප්‍රේමයෙන් මන
   2) ආලෙ බැන්ද, ප්‍රේමයෙන් මන, ගල්ලෙන බිඳලා
   3) යුද්දෙට මං ගියා, ගල්ලෙන බිඳලා, සෝබාව දේ මෙපුර
   4) ගම්සිර කාලිංග නුවර, ප්‍රේමයෙන් මන, ගල්ලෙන බිඳලා

36. අභිමාන් චිත්‍රපටයේ එන ගීතයකි.
   1) තේරේ මේරේ  2) තූ ගංගා  3) භගවා භගවා  4) කෙසෙදිවානධී

37. අපි එකට යමු ගමන පද පෙලේ මාත්‍රා බෙදීම අනුව ගැලපිය හැකි තාලය වනුයේ.
   1) ත්‍රිතාල්  2) ජප්තාල්  3) දීප්චන්දි  4) දාදරා

38. ස්වර පුවරු භාණ්ඩයක් නොවන්නේ.
   1) එකෝඩියන්  2) මෙලෝඩිකා  3) වයලීනය  4) හාර්මෝනියම්

39. නාඩගම් තාලයකි.
   1) දාදරා  2) තිර්ලානා  3) තකහෙර්වා  4) ජප්

40. ප සිට නි දක්වා ඇති දුර ටෝන් සහ සෙමිටෝන් වලින්
   1) ටෝන් 2 සෙමිටෝන් 3
   2) ටෝන් 1 සෙමිටෝන් 4
   3) ටෝන් 2 සෙමිටෝන් 4
   4) ටෝන් 2 සෙමිටෝන් 3

අවසාන වාර පරීක්ෂණය

10 ශ්‍රේණිය

පෙරදිග සංගීතය (සිංහල) - 11

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. 1 සිට 5 තෙක් ප්‍රකාශ වැරදිය. ඒවා නිවැරදි කර ලියන්න.
   I. භෛරවී රාගයේ විකෘති ස්වර 5 ක් යෙදේ.
   II. ම (මධ්‍යම) තීව්‍ර වන්නේ ඛමාජ් රාගයේය.
   III. නාඩගම් සම්ප්‍රදායේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ ඩෝලයයි.
   IV. රුක්මනී දේවි බයිලා ගායිකාවකි.
   V. බැද්ද වටට සුදු මොර මල් යන ගීතය ආඝාතාත්මක ගැමි ගීතයකි.

   VI. ඛමාජ් රාගයේ අවරෝහනයේ කෝමල වන ස්වරය කුමක්ද?
   VII. O. මෙම සංකේතයේ වටිනාකම මාත්‍රා කීයද?
   VIII. ධ ධින ධතුනා ආවර්ත ගණන කීයද?
   IX. බටහිර සංගීත සිම්ෆනි ( symphony) රචකයකු නම් කරන්න.
   X. හරිප්‍රසාද් චෞරසියා ……………………………..වාදකයෙකි.
   XI. ගුවන් විදුලි සරල සංගීතයේ මුල් යුගයේ ගායකයෙකු වන්නේ …………………………………… මහතායි.
   XII. තබ්ලාවේ නිර්මාතෘ ……………………………………….

2.
   I. පහත දැක්වෙන්නේ ලංකාවේ පවතින ගී වර්ග තුනකට අයත් විශේෂ ලක්ෂණය.ඒ වගුවේ නියමිත ස්ථානවල ලියා වගුව සම්පූර්ණ කරන්න.
      - කොලොම්බිය හා HMV වැනි සමාගම් තරගයට තැටි ගීත නිශ්පාදනය කිරීම.
      - භාරතීය සංගීතඥයින්ගේ ගී තනු එක්වීම.
      - ගීත රචකයින් හා සංගීත නිර්මාණ කරුවන් බිහිවීම.
      - ඉන්දීය ගී තනු අනුකරණය කිරීම.
      - මුල් ගී තනුවල රාගාශ්‍රිත නිර්මාණ තිබීම.
      - දොහොරා කොටස් වලින් යුක්ත වීම.

| ව්‍යාප්තිය | ග්‍රැමෆෝන් තැටි ගී | ගුවන් විදුලි සරල ගී | නූර්ති |
|---|---|---|---|
| විශේෂ ලක්ෂණය | | | |

   II. ග්‍රැමෆෝන් තැටි ගීත පිළිබඳ කරුණු පහක් ලියන්න.
   III. මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී නිර්මාණ කරුවන් දෙදෙනකු නම් කරන්න.
   IV. ඔවුන් ගැයු ගීත තුන බැගින් නම් කරන්න.

3. පහත සඳහන් ස්වර අභ්‍යාස කොටස්ඇසුරින් අසාඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) ස රි ග ප ධ ස ධ ප ග ප ධ ප ග රි ස

(ආ) නිරි ගම/ පම/ ගරි ගම/ පම/ ගරි ස

   I. (අ) සහ (ආ) ස්වර අයත් රාග නම් කරන්න.
   II. මෙම රාග දෙකෙන් එකක වාදී, සංවාදී, ගායන සමය ලියන්න.
   III. ඉහත එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක් නම් කර ගීතයට අයත් තාලය නම් කරන්න.

4. පහත සඳහන් හින්දුස්ථානී තාලය ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| ධා | ධිං | _ | ධා | ධා | ධිං | _ | තා | තිං | _ | ධා | ධා | ධිං | _ |
| x | | | 2 | | | | 0 | | | 2 | | | |

   I. ප්‍රදර්ශනය කර ඇති තාලයේ නම කුමක්ද?

www.eduLanka.LK

II. ඉහත තාලයේ ධෙබාව දෙවරක් වැයීමේදී ආවර්ත කීයක් ලැබේද?

III. x, o මෙම සංකේත දෙක කෙටියෙන් පැහැදිලි කරන්න.

IV. මෙම තාලයට ගැලපෙන දේශීය බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

5. පහත දැක්වෙන වගුවට බටහිර සංගීතය ඇසුරින් පිළිතුරු සපයන්න.

I.

| | නම | සංකේතය | සංකේතයේ මුල් වටිනාකම | තිතට එකතුවන වටිනාකම | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|
| (අ) | ඩොටඩ්සෙමිබ්‍රිව් | ................ | 4 | ................ | 6 |
| (ආ) | ................ | d. | 2 | 1 | ................ |
| (ඇ) | ඩොටඩ්ක්‍රොචට් | ................ | ................ | $^1/_2$ | $1^1/_2$ |

II. පහත සඳහන් බටහිර සංගීතයට අයත් පාරිභාෂික වචන පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(අ) Flat Mark

(ආ) Dotted Note

(ඇ) Ledger Line

III. ($B^b$) B flat මේජර් ස්කේලයට අයත් ස්වර ලියා දක්වන්න.

6. ශ්‍රී ලංකාවේ දේශීය ගායනා "ගැමි ගී" සහ "සේ ගී" වශයෙන් කොටස් දෙකකට බෙදේ. මෙම ගී වර්ග දෙකට අදාලව පහත වගුව සම්පූර්ණ කරන්න. (මෙම වගුව ඔබගේ උත්තර පත්‍රයට පිටපත් කර ගන්න)

| ගී වර්ගය | අදාල විස්තරය | විශේෂිත කරුණු | නිදසුන් |
|---|---|---|---|
| ගැමි ගී | ගැමියන් විසින් නිර්මිත ගී ලක්ෂණ 3ක්.<br>1. ....................<br>2. ....................<br>3. .................... | 1. වෘත්තීන් මත ගොඩනැගුණු ගී<br>2. ....................<br>3. සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණු ගී | 1. ....................<br>2. ....................<br>1. ....................<br>2. ....................<br>1. ....................<br>2. .................... |
| සේ ගී | උගතුන් විසින් රචිත ගි ලක්ෂණ 03 ක්<br>1. ....................<br>2. ....................<br>3. .................... | මහනුවර කවිකාර මඩුව ආශ්‍රිතව ගොඩනැගුණු ගී | 1. ....................<br>2. .................... |

I. නාදයේ ත්‍රිවිද ගුණ නම් කරන්න.

II. ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

III. ග්‍රහ ත්‍රිවිධ ආකාර වේ. ත්‍රිවිධ ග්‍රහ නම් කරන්න.

IV. ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

www.eduLanka.Lk



ඉස්කෝලේ edulanka.lk